" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අැප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI SYSTEM CERTIFIED ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-AP/03/FI/17
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2019.09.06

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.).

## <u>සැපයුම්කරුවන් වෙත එකතු කල අගය මත බද්ද (VAT) ගෙවීම.</u>

සැපයුම්කරුවන් වෙත එකතු කල අගය මත බද්ද (VAT) ගෙවීමට අදාලව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද 2019.07.09 දිනැති සහ අංක CGIR/2019/3v(Ins. & Cir) දරණ ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.

02. ඒ අනුව ඉහත සඳහන් ලිපියේ විධිවිධාන පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

එන්.බන්දුල ප්‍රේමකුමාර,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)
ප්‍රධාන ලේකම්,පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதிப் பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මූල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
# உள்நாட்டு இறைவரித் திணைக்களம்
# DEPARTMENT OF INLAND REVENUE

ලේකම් අංශය
දේශීය ආදායම් ගොඩනැගිල්ල
සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 02
ශ්‍රී ලංකාව
දුරකථන :- 011-2334400/011-2135400
ෆැක්ස් :- 011-2337777

செயலகம்
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு 02
இலங்கை
தொலைபேசி :- 011-2334400/011-2135400
பக்ஸ் :- 011-2337777

Secretariat
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 02
Sri Lanka
Telephone :- 011-2334400/011-2135400
Fax :- 011-2337777


මගේ අංකය: CGIR/2019/3v(Ins. & Cir) 09.07.2019

අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

ප්‍රධාන ගණකාධිකාරීවරුන්,

සංස්ථා,ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය ව්‍යවසාය ආයතන ප්‍රධානීන්,

**<u>සැපයුම්කරුවන් වෙත එකතු කළ අගය මත බද්ද (VAT) ගෙවීම.</u>**

රාජ්‍ය ආයතන සහ රජයට අයත් ආයතන විසින් සැපයුම්කරුවන් වෙත ගෙවීම් කිරීමේදී එම ගෙවීම මත අදාල VAT මුදල, අක්‍රීය බදුගෙවන්නන් සහ තාවකාලික VAT ලියාපදිංචි පුද්ගලයන් වෙත ගෙවීම් කර ඇති බව මා වෙත නිරීක්ෂණය වී ඇත. මේ මගින් රාජ්‍ය ආදායම එකතු කර ගැනීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉමහත් දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වී ඇත. එසේ ගෙවන ලද VAT මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකර රජයට ලැබිය යුතු ආදායම වෙනත් පුද්ගලයන් රඳවාගෙන ඇත. එබැවින් සැපයුම්කරුවන් වෙත VAT මුදල ගෙවීමේදී පහත කරුණු කෙරෙහි ඔබගේ දැඩි අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමි.

1. සැපයුම්කරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංකයක් (TIN) ලබා ගෙන ඇති බවට එම සහතිකය මගින් තහවුරු කර ගත යුතු අතර VAT සඳහාද ලියාපදිංචිය ලබාගෙන තිබිය යුතුය.

2. ස්ථිර VAT ලියාපදිංචි තැනැත්තන් සඳහා TIN අගට 7000 උප අංකය ඇතුළත් වේ. VAT සඳහා ස්ථිර ලියාපදිංචිය ලබා තිබුනද සැපයුම්කරු ක්‍රියාකාරී බදු ගෙවන්නෙකු (Active) බවට ද සහතික කර ගත යුතුය.

3. TIN හි අග 2525 උප අංකය සඳහන් වන්නේ නම් එය තාවකාලික ලියාපදිංචියක් වේ. එවැනි තැනැත්තන්ට VAT ගෙවීම සිදු නොකළ යුතුය.

4. ඒ අනුව ස්ථිර VAT ලියාපදිංචියක් ඇති, VAT සඳහා ක්‍රියාකාරී ලිපිගොනුවක් පවත්වාගෙන යනු ලබන සැපයුම්කරුවන්ට පමණක් අදාළ VAT මුදල ගෙවිය යුතු වේ.

02. ඒ අනුව සැපයුම්කරු සම්බන්ධව ඉහත තොරතුරු සනාථ කර ගැනීම සඳහා, පහත දක්වා ඇති ක්‍රියාපිලිවෙල අනුගමනය කල හැකිය.

- **සැපයුම් අනුමැතිය ලබා දීමට පෙර,**

I. වැට් බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තා සක්‍රිය බදු ගෙවන්නෙකුද යන්න පහත දුරකථන අංක අමතා දෙපාර්තමේන්තුව වෙතින් තහවුරු කර ගත හැකිය.

| | | | |
|---|---|---|---|
| ව්‍යාපාර උපදේශන අංශය | එම්.පී. අමරතුංග මිය | කොමසාරිස් | 0112134251<br>0112134284<br>0112134253 |
| සේවාදායක උපකාරක හා ප්‍රවර්ධන අංශය | එච්.බී.ඒ. චන්ද්‍රානි මිය | කොමසාරිස් | 0112134250<br>0112134223<br>0112134222<br>ෆැක්ස් - 2338924 |

II. මීට අමතරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙ Web අඩවියේ (www.ird.gov.lk) ඇතුලත් කර ඇති VAT ලිපිගොනු අක්‍රිය කරන ලද බදු ගෙවන්නන්ගේ නාම ලේඛණය මඟින් වැට් බදු අංකය අක්‍රිය කරන ලද එකක්දැයි තවදුරටත් තහවුරු කර ගත හැකිය.

- **ගෙවීම් කිරීමට පෙර,**

**සැපයුම්කරුගේ වැට් බදු ලියාපදිංචි අංකය ක්‍රියාකාරි මට්ටමේ තිබේදැයි සනාථ කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවාදායක උපකාරක හා ප්‍රවර්ධන අංශය වෙත පහත ආකෘතියට අනුව විස්තර ඉදිරිපත් කිරීමෙන් ලිපියක් ලබාගැනීමට පහසුකම් සලසා ඇත.**

| **සැපයුම්කරුගේ නම** | **ලිපිනය** | **වැට් ලිපිගොනු අංකය** |
|---|---|---|
| | | |

03. තවද සැපයුම්කරුවන් වෙත කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත සඳහන් ආකෘතියට අනුව සෑම කාර්තුවක් (ජනවාරි - මාර්තු/ අප්‍රේල් - ජූනි/ ජූලි - සැප්තැම්බර්/ ඔක්තෝබර් - දෙසැම්බර්) අවසන් වී ඊලඟ මාසයේ 15 දිනට පෙර ජ්‍යෙෂ්ඨ කොමසාරිස්, තොරතුරු හා අනිවාර්ය ලියාපදිංචි අංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ 02 ලිපිනයට යොමු කරන්න.

| අනු අංකය | සැපයුම්කරුගේ නම හා ලිපිනය | ලබාගත් සැපයුමේ විස්තරය | TIN අංකය | ගෙවීම් කරන ලද දිනය | ගෙවූ මුදල | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | VAT රහිත මුදල | VAT | මුළු මුදල (VAT සහිත) |
| | | | | | | | |

නදුන් ගුරුගේ
කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සී.ඒ.ගාඩිනර් මාවත
කොළඹ 02.

**නදුන් ගුරුගේ**
**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**
**පිටපත් -**
**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

1. ජ්‍යෙෂ්ඨ කොමසාරිස් - බදු උපකාරක සේවා හා පාරිභෝගික ප්‍රවර්ධන අංශය
2. ජ්‍යෙෂ්ඨ කොමසාරිස් - තොරතුරු හා අනිවාර්යය ලියාපදිංචි අංශය
3. කොමසාරිස් - ව්‍යාපාර උපදේශන අංශය
4. කොමසාරිස් - සේවාදායක උපකාරක හා ප්‍රවර්ධන අංශය
5. කොමසාරිස් - තොරතුරු අංශය